**පලාගල ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 23 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 07 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**
**-------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට පලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**
**------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**-------------------------**

විගණනයට ඉදිරිපත් කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී රු.2,954,141 ක ශුද්ධ මුදල් ප්‍රවාහයක් දක්වා තිබුණු නමුත් සභාවේ ආරම්භක හා අවසන් මුදල් ශේෂ අනුව ශුද්ධ මුදල් ප්‍රවාහය රු.1,839,356 ක් විය.ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.1,114,785 ක නොසැසඳීමක් දක්නට විය.

**2. මූල්‍ය සමාලෝචනය**
**-------------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**
**-----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.2,238,943 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.633,421 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 වරිපනම් බදු**

සභා බල ප්‍රදේශයේ පිහිටි සංවර්ධිත ප්‍රදේශ හඳුනාගෙන අදාළ දැන්වීම් කර වරිපනම් බදු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 මුද්දර ගාස්තු**

සමාලෝචිත වර්ෂයට අදාළව සභාවට අයවිය යුතු මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණු අතර 2013 වර්ෂය අවසන් වන විට හිඟව පැවති රු.687,975 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂය තුළදී අයවී නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**(අ)** ලැබිය යුතු ගිණුම් තුළ දක්වා තිබුණු රු.499,099 ක ශේෂයක් 2010-2012 කාලය තුළ ක්‍රියාත්මක කර තිබුණ ගම නැගුම සංවර්ධන ව්‍යාපෘති 06 කට අදාළව ලැබිය යුතු බවට දක්වා තිබුණු ශේෂයක් වු අතර එම මුදල නිශ්චිතව හඳුනා ගෙන අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**(ආ)** ගෙවිය යුතු ගිණුම් තුළ කර්මාන්ත ණය හිමියන් යටතේ දක්වා තිබුණු රු.2,191,490 ක ශේෂයක් 2010-2013 කාලය තුළ ක්‍රියාත්මක කරන ලද විවිධ ව්‍යාපෘති 19 කට අදාළව ගෙවිය යුතු මුදල් වන අතර එම ණය ශේෂ නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**04. පද්ධති හා පාලනය**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** ආදායම් පරිපාලනය.

**(ඇ)** වත්කම් කළමනාකරණය

**(ඈ)** ණය ගැති හා ණය හිමි පාලනය.